*සැ. යු.* - 2025.04.11 දින පළ වූ අංක 2432 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,433 - 2025 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2025.04.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : II (ආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 674 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 676 |
| රජයේ නොවන දැන්වීම් ... ... | 677 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 මැයි මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අප්‍රේල් මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,<br>
කොළඹ 08,<br>
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**<br>
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

673 - B 082673 — 5,403 (2025/04)
F 1 -

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - අක්කරපත්තුව**

අක්කරපත්තුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2025

01. අක්කරපත්තු මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් නඩු භාණ්ඩ 2025.05.03 වැනි දින පෙ.ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

03. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගත හැකි අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය.

05. සියළුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු වන අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කල යුතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අක්කරපත්තුව.

*උපලේඛනය*

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *එකතුව* |
|---|---|---|---|
| 01 | 60029/TOP/21 | 206-8329 ත්‍රි රෝද Three Wheel | 01 |
| 02 | 62167/E/21 | EP AAZ 9314 ත්‍රි රෝද Three Wheel | 01 |
| 03 | 66858/MIS/23 | EP SE 5719 අත් ට්‍රැක්ටර් | 01 |
| 04 | 63266/WL/22 | EP WP 0642 යතුරු පැදිය | 01 |
| 05 | 67002/MT/23 | Honet යතුරු පැදිය | 01 |
| 06 | 64255/E/24 | EP BEW 3803 යතුරු පැදිය | 01 |
| 07 | 68386/E/24 | EP VB 0555 යතුරු පැදිය | 01 |
| 08 | 63518/E/21 | EP MD 2406 යතුරු පැදිය | 01 |

04 - 114

**මහෙස්ත්‍රාත් අධිකරණය - සම්මන්තුර**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2025.04.26 වැනි දින පෙරවරු 9.30ට සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිතය.

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින **පෙ.ව. 8.00** සිට **පෙ.ව. 9.00** දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත්කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහි දී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසිය සිදුකරන අවස්ථාවේදී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගී වීමට පැමිණෙන අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතුය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
සම්මන්තුර.

2025 අප්‍රේල් මස 09 වැනි දින.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 01 | AR/15/24 | HL - 0266 | යතුරු පැදිය (අමතර කොටස් සඳහා පමණි) | 1 |
| 02 | 30428/ODD/23 | BCQ - 6506 | යතුරු පැදි | 1 |
| 03 | 33180/E/24 | | ලිප් | 1 |
| 04 | 33180/E/24 | | සිලින්ඩර | 1 |
| 05 | 33180/E/24 | | වළං | 1 |
| 06 | 33523/Misc/24 | | යකඩ බාල්දි | 1 |
| 07 | 33540/Misc/24 | | සවල් | 1 |
| 08 | 30771/Misc/23 | | සවල් | 1 |
| 09 | 30771/Misc/23 | | යකඩ බාල්දි | 1 |
| 10 | 29510/Misc/23 | | සවල් | 1 |
| 11 | 29510/Misc/23 | | යකඩ බාල්දි | 2 |
| 12 | 30219/Misc/23 | | සවල් | 1 |
| 13 | 30318/Misc/23 | | සවල් | 1 |
| 14 | 32903/Misc/23 | | සවල් | 1 |
| 15 | 33541/Misc/24 | | සවල් | 1 |
| 16 | 25823/Misc/21 | | සවල් | 1 |

04 - 163

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**එරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් රේන්ද විකිණීම

**2025 ජූලි මස සිට 2026 ජූනි මස දක්වා**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආරුමුගත්තාන් කුඩියිරුප්පු රා තැබෑරුම් සඳහා 2025 ජූලි මස 01 දින සිට 2026 ජූනි මස 30 දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් ඒරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුය.

1. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1500.00 මුදලක් එරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකිය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2025.05.02 දින සිට 2025.05.16 දින ප.ව. 3.00 දක්වා.

2. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට නොඅඩු නොවිය යුතුය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් සමග ඇමිණිය යුතුය.

3. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුලත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

5. **දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාල වලටත් තිබේදැයි සහතික නැත**

6. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේදී සහභාගී වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කල හැකිය. ඒ සමග සංගම දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමූපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව).

7. අනිකුත් තොරතුරු එරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

කේ. තනපාලසුන්දරම්,
ප්‍රාදේශීය ලේකම්,

2025 අප්‍රේල් මස 18 වැනි දින.
එරාවූර් පත්තුව, වෙංකලඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | දිනය | වේලාව |
| ආරුමුගත්තාන් කුඩියිරුප්පු | ඔඹ හඩ 1 | 2025.06.12 | පෙ.ව. 10.00 |

**සටහන :** 1. ටෙන්ඩර් කමිටුව 2025.06.12 දින පෙ.ව. 10.00 ට රැස්වේ
2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීම 2025.06.19 දින පෙ.ව. 10.00 ට පැවැත්වේ.

04 - 111

---

# රජයේ නොවන දැන්වීම්

**මහජන දැනුම්දීම**

**පොදු සමාගමකට පරිවර්තනය කිරීමේදී නම වෙනස් කිරීම**

2007 අංක 07 සමාගම් පනතේ 11(5) වගන්තියට අනුව දැනුම් දෙනු ලබනුයේ, අංක 01, ඉන්ඩස්ට්‍රියල් සෝන්, අච්චුවේලි ලිපිනයෙහි ලියාපදිංචි වෙන්කඩේෂ්වර ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (ලියාපදිංචි අංකය PV 99258) 2025 අප්‍රේල් 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි මහජන ආයතනයක් බවට පරිවර්තනය කරනු ලබන බවයි. පනතේ 28 වන වගන්තියට අනුකූලව සහ සමාගම එහි නාමය, පනතේ 11(1) වගන්තියට අනුකූලව වෙන්කඩේෂ්වර ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රි ලිමිටඩ් ලෙස වෙනස් කර ඇති බව සලකනු ලැබේ;

මණ්ඩලයේ නියෝගයෙන්,

**සමාගම් ලේකම්වරු.**

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
03 වන මහල, අංක 09 - 1/2,
පාසල් පටුමග, කොල්ලුපිටිය,
කොළඹ 03.

04 - 130

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වනවගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

රැෆල්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය පීවී 00236207
සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීම

සාමාජිකයන්ගේ ස්වේච්ඡා ඇවර කිරීමක් වශයෙන් මෙම සමාගම ඇවර කිරීමටත්, කොළඹ 3, පාසල් වීදියේ අංක 09, තුන් වන මහලේ වරලත් ගණකාධිකාරී විදාන ආරච්චිලාගේ වානක පුෂ්පකුමාර මහතා සමාගමේ ඇවරකරු වශයෙන් වර්ෂ 2025 ක් වූ අප්‍රේල් මස 08 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීමටත්, නුගේගොඩ මිරිහාන, කෝට්ටේ පාර අංක 262, සහරා ශාලාවේ දී වර්ෂ 2025 ක් වූ

අප්‍රේල් මස 08 වන දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී 2007 අංක 07 දරන සමාගම් පනතේ (319)(1) (ආ) යටතේ යෝජනා සම්මතයක් අනුමත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) දරන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විදාන ආරච්චිලාගේ වානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09,
03 වන මහල, පාසල් පටුමග,
කොළඹ 03.

04 - 131/1

---

2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වන වගන්තිය ප්‍රකාරව වූ නිවේදනයයි

රූෆල්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් අංකය පීවී 00236207
ඇවරකරුවෙකු පත්කිරීමේ නිවේදනය

වර්ෂ 2025 ක් වූ අප්‍රේල් මස 08 වන දින පවත්වනු ලැබූ මෙම සමාගමේ අති විශේෂ මහා සභා රැස්වීමක දී රූෆල්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ඇවරකරු වශයෙන් සමාගමේ විශේෂ යෝජනා සම්මතයෙන් මා පත් කරන ලද බව කොළඹ 3, පාසල් වීදියේ අංක 09, තුන් වන මහලේ වරලත් ගණකාධිකාරි විදාන ආරච්චිලාගේ වානක පුෂ්පකුමාර වන මම මෙයින් නිවේදනය කරමි.

විදාන ආරච්චිලාගේ වානක පුෂ්පකුමාර,
ඇවරකරු.

අංක 09,
03 වන මහල, පාසල් පටුමග,
කොළඹ 03.

04 - 131/2

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පහත දක්වා ඇති සමාගමේ නාමය වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නම : කැපිටල් හෝස්පිටැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00260288
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 10, ඇල්බට් ක්‍රෙසන්ට්, කොළඹ 07.
සමාගමේ අලුත් නාමය : ඩී ඇන්ඩ් බී හෝස්පිටැලිටි (ප්‍රයිවට්) ලිමිටඩ්

ජී ඩබ්ලිව් සෙක්‍රටරිස් ඇන්ඩ් එකවුන්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04 - 132

## 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 59 (2) කොටස යටතෙහි මහජන දැනුම්දීමයි

කොළඹ 03, ගාලු පාරේ, ලී හෙජස් ටවර් හි, 4 වන මහලේ, නො. 349 හි පිහිටි ලියාපදිංචි කාර්යාලය වන ඒෂියා සිකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 130083) එහි ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් මිලියන එකසිය තිස් අටයි සියයක් සිට (රු. 138,000,100/-) සිට ශ්‍රී ලංකා රුපියල් මිලියන තිස් අටයි සියයක් (රු. 38, 000,100/-) දක්වා අඩු කරන ලෙස යෝජනා කර ඇති බව සමාගම් පනතෙහි 59(2) කොටස ප්‍රකාරව මෙයින් දැනුම්දෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.
ඒෂියා සිකියුරිටීස් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

04 - 144

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ “සර්වෝදය ග්ලෝබල් ගේට්වේ (පීවීටී) එල්ටීඩී” නැමති සමාගම පහත දැක්වෙන පරිදි නාමය වෙනස් කර 2025.03.28 දින ලියාපදිංචි කරන ලදි.

සමාගමේ පෙර නාමය : සර්වෝදය ග්ලෝබල් ගේට්වේ (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 00310810
ලියාපදිංචි ලිපිනය : අංක 98, රාවතාවත්ත පාර, මොරටුව
සමාගමේ නව නාමය : සරෝදා ග්ලෝබල් ගේට්වේ (පීවීටී) එල්ටීඩී

කෝපරේට් කන්සාල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 48,
රෝස්මිඩ් පෙදෙස,
කොළඹ 07.

04 - 150

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.